දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මුලතිව්.
ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සහ ස්ථාවර නියෝග අංක 119(4)
ප්‍රකාරව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කර
ඇති වාතර්ා සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳ කරුණු
ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : மாவட்ட செயலகம், முல்லைத்தீவு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால்
முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற்
கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின்
அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும்
நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

District Secretariat, Mullaitivu.
Submission of observations of Hon. Minister and steps taken with regard to the reports Tabled by the committee of Public Accounts in Terms of standing Order No. 119(4)

දිස්ත්‍රික් ලේකම් කායර්ාලය, මුලතිව්

ගරු අමාත්‍යතුමාගේ නිරීක්ෂණ සහ ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කර ඇති වාතර්ා

සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම

ස්ථාවර නියෝග අංක 119(4) ප්‍රකාරව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධයෙන් ගෙන ඇති පියවර සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 79
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මුලතිව්

අංක	කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග	වර්තමාන තත්වය
1 කොටස : 80.00			
01	රථවාහන ලේඛනය දෛනිකව යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබීම. ඇප ලේඛනය දෛනිකව යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබීම.	යාවත්කාලීන කර නිසි පරිදි පවත්වාගෙන යන ලෙස අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.	යාවත්කාලීන කර නිසි පරිදි පවත්වාගෙන යනු ලැබේ.
02	අංක 171/2004 හා 2004-05-11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව සෑම තෙමසකට වරක්ම මෘදුකාංග පද්ධතියේ පළමුවන, දෙවන සහ තෙවන මුරපද වෙනස් කර නොතිබීම.	අංක 171/2004 හා 2004-05-11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව සෑම තෙමසකට වරක්ම මෘදුකාංග පද්ධතියේ පළමුවන, දෙවන සහ තෙවන මුරපද වෙනස් කරන ලෙස සහ එසේ වෙනස් කරනු ලබන මුරපද ලේඛනගත කර තබන මෙන් අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.	සෑම තෙමසකට වරක්ම එම මුරපද වෙනස් කර ඇති අතර 2024 වර්ෂයේ සිට ලේඛනයක් පවත්වාගෙන යනු ලැබේ.
03	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුම් සියල්ලටම එක් මසක් ඇතුළත පිළිතුරු ලැබී නොමැත.	ජාතික සහ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා එක් මසක් ඇතුළත පිළිතුරු ලබා දීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.	2022 මූල්‍ය වර්ෂයේ දී ජාතික විගණන විමසුම් 20 ක් ලැබී ඇති අතර එම විගණන විමසුම් 20 සඳහාම පිළිතුරු සපයා ඇත. අභ්‍යන්තර විගණන විමසුම් 53 ක් ලැබී ඇති අතර ඒ අතරින් විගණන විමසුම් 52 සඳහා නියමිත කාල සීමාව ඇතුළත පිළිතුරු සපයා ඇත. ජාතික සහ අභ්‍යන්තර විගණන විමසුම් සඳහා එක් මසක් ඇතුළත අවසන් හෝ අන්තර්කාලීන පිළිතුරක් ලබා දීමට මේ වන විට කටයුතු කෙරේ.
04	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා එක් මසක් ඇතුළත පිළිතුරු ලබා නොදුන් අවස්ථා නිබීම.		
05	වර්ෂය ආරම්භයේදීම මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ උපදෙස් ලබාගෙන අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කිරීමට කටයුතු නොකිරීම.	වර්ෂය ආරම්භයේදීම අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.	2023 සහ 2024 වර්ෂයන් ආරම්භයේදීම අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කර ඇත.

06	අංක 01/2017 හා 2017.06.26 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වැනි ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයට අදාළ වත්කම් මිලදී ගැනීම් සහ බැහැර කිරීම් පිළිබඳ තොරතුරු කම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වත්කම් මිලදී ගැනීම සහ බැහැර කිරීම සම්බන්ධයෙන් කම්ප්ට්‍රෝලර් ජනරල් කාර්යාලයට දැනුම් දීමට කටයුතු කර ඇති අතර වත්කම් මිලදී ගැනීම සහ බැහැර කිරීම පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන යන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	අංක 01/2017 හා 2017.06.26 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වැනි ඡේදය ප්‍රකාරව තොරතුරු කම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇති අතර වත්කම් මිලදී ගැනීම සහ බැහැර කිරීම සඳහා වන ලේඛනය වර්ෂ 2024 සිට පවත්වාගෙන යනු ලැබේ.
07	සමීක්ෂණ මණ්ඩලය මඟින් අනාවරණය කරන ලද අතිරික්තයන්, හිඟයන් පිළිබඳ නිර්දේශ සහ අනෙකුත් නිර්දේශයන් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	එම නිර්දේශ ක්‍රියාවට නංවන ලෙසත්, වට්ටෝරුගත භාණ්ඩවල අතිරික්ත හා හිඟය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.	අතිරික්ත හා හිඟය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර දැනට 2024 වර්ෂයේ සිට වට්ටෝරුගත භාණ්ඩවල අතිරික්තයක් හෝ හිඟයක් නොමැත.
08	ගර්හිත කර මාස අටකට අඩු හයක කාලයක් ඇතුළත ගර්හිත කළ වාහන අපහරණය සඳහා පියවර ගෙන නොතිබීම.	රජයේ කාර්ය පටිපාටීන්ට අනුව 2023 වර්ෂයේ සිට ගර්හිත කළ වාහන අපහරණය සඳහා පියවරින් පියවර කටයුතු කර ඇත.	මෙම ගැටලු විසඳීම සඳහා පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. • එක් වාහනයක් විකුණා ඇත • යතුරු පැදි පහක්, ට්‍රැක්ටරයක් සහ වාහන දෙකක් මැරිටයිම්පත්තු සහ පුදුකුඩ්ඉරුප්පු ප්‍රදේශීය සභාවන් වෙත ලබා දී ඇත. • තවත් වාහන දෙකක් අලුත්වැඩියා කිරීමට තීරණය කර ඇත.
09	සියලුම රථවාහනවල හිමිකාරිත්වය සනාථ කිරීම සඳහා වන ලියකියවිලි සන්තකයේ නොතිබීම.	රථවාහනවල හිමිකාරිත්වය සනාථ කර ගැනීමට හෝ වෙනස් කර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම හෝ ඒ සඳහා උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත.	වාහන 06 ක අයිතිය වෙනස් කිරීමට සිදු විය. දැනට වාහන 05 ක අයිතිය වෙනස් කර ඇති අතර ද්විත්ව කාර්යය වාහනයක හිමිකාරිත්වය පමණක් වෙනස් කළ යුතුව ඇති අතර ඒ සඳහා කටයුතු කරමින් පවතී.
10	වර්ෂ එකකට වඩා වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති හිඟ හිටි ශේෂයන් නිරවුල් කර නොමැත.	අමාත්‍යාංශ ලේකම්වරයාගේ සහ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොපියවා තිබූ රු. 157,959.90 ක මුදලක් 2023 ගිණුම් වර්ෂයේ දී කපා හැරීමට කටයුතු කරන ලදී.	නොපියවා තිබූ රු. 157,959.90 ක මුදලක් 2023 ගිණුම් වර්ෂයේ දී කපා හරින ලදී. දැනට වර්ෂ එකකට වඩා වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති හිඟ හිටි ශේෂයන් නොමැත.
11	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබීම.	ඉඩම් තැන්පතු හැර අනෙකුත් කල් ඉකුත් වූ තැන්පතු මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව නිරවුල් කිරීම සඳහා කටයුතු කරන ලදී.	2022 වර්ෂයේ දී පහත සඳහන් කල් ඉකුත් වූ තැන්පතු ශේෂයන් පැවතුනි. වර්ෂ 1 – 2 තැන්පතු රු. 7,498,832.75 වර්ෂ 2 – 4 තැන්පතු රු. 4,037,134.31 අවශ්‍ය කටයුතු කිරීමෙන් පසුව, 2023 වර්ෂයේ දී පැවති තැන්පතු ශේෂයන් පහත පරිදි වේ, • 2024-08-13 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වර්ෂ 1 - 2 අතර තැන්පතු ප්‍රමාණය රු. 1,821,303.40 • 2024-08-13 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වර්ෂ 2 – 4 අතර තැන්පතු ප්‍රමාණය රු. 229,286.70

2 කොටස : 65.00			
12	මාස්පතා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුනි.	ඒ පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා වෙත දැනුම් දී ඇත.	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාගේ සහභාගිත්වය ලැබෙන පරිදි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වසරකට තෙවරක් හෝ සිව්වරක් පවත්වනු ලැබේ.
13	දිස්ත්‍රික් ලේකම්වරයා විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම් මාස්පතා පවත්වා නොතිබුනි.	ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම මාස්පතා පැවැත්වීමට අවශ්‍ය පියවර ගෙන ඇත.	ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රැස්වීම සෘජුව හෝ සූම් තාක්ෂණය ඔස්සේ පවත්වනු ලබන අතර 2024 වර්ෂයේ සිට රැස්වීම් රෙජිස්ටරයක් පවත්වාගෙන යනු ලැබේ.
14	වර්ෂ 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනතේ විධිවිධානයන්ට අනුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් පවත්වා නොමැත.	වර්ෂ 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපනතේ විධිවිධානයන්ට අනුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් පවත්වන ලෙසට අදාළ නිලධාරී දැනුවත් කර ඇත.	2022 වර්ෂයේ සිට සෑම කාර්තුවකට වරක්ම දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් පවත්වා ඇත.
15	දිස්ත්‍රික් නිවාස කමිටුව මාස්පතා කැඳවා නොතිබුනි.	මාස්පතා රැස්වීම් පවත්වන ලෙසට අදාළ නිලධාරී දැනුවත් කර ඇත. ඒ බව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති වෙත ද දැනුම් දී ඇත.	2024 වර්ෂයේ සිට මෙම රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත.
16	දිස්ත්‍රික් පාරිසරික කමිටුව අවම වශයෙන් දෙමසකට වරක්වත් කැඳවා නොතිබුනි.	මෙම රැස්වීම් අවම වශයෙන් දෙමසකට වරක්වත් පවත්වන ලෙසට අදාළ නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත.	2024 වර්ෂයේ සිට දිස්ත්‍රික් පාරිසරික කමිටු රැස්වීම් අවම වශයෙන් දෙමසකට වරක් හෝ කාර්තුවකට වරක් හෝ පැවැත්වීමට කටයුතු කර ඇත.
17	දිස්ත්‍රික් කෘෂි රසායන සම්බන්ධීකරණ කමිටුව මාස්පතා කැඳවා නොතිබුනි.	දිස්ත්‍රික් කෘෂි රසායන සම්බන්ධීකරණ කමිටු රැස්වීම් මාස්පතා පවත්වන ලෙසට අදාළ නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත.	දිස්ත්‍රික් කෘෂි රසායන සහකාර අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පැවතුනද, 2024 වර්ෂයේ සිට දිස්ත්‍රික් කෘෂිකර්ම රැස්වීම් සමඟ දිස්ත්‍රික් කෘෂි රසායන සම්බන්ධීකරණ කමිටු රැස්වීම් ද පවත්වා ඇත.
18	දිස්ත්‍රික් මිල පාලන කමිටු රැස්වීම් මාස්පතා පවත්වා නොතිබුනි.	දිස්ත්‍රික් මිල පාලන කමිටු රැස්වීම් මාස්පතා පවත්වන ලෙසට අදාළ නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත.	2023 වර්ෂයේ සිට නොකඩවා අර්ධ වාර්ෂිකව දිස්ත්‍රික් මිල පාලන කමිටු රැස්වීම් පවත්වා ඇත.
19	සකස් කර ඇති මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළින් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත වර්ෂයක් සඳහා එක් අයකුට අවම වශයෙන් පැය 12 ක අමතර පුහුණු අවස්ථාවක් ලබා දී නොතිබීම.	කාර්යය මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා ලබා දීමට පියවර ගෙන ඇත.	2024 වර්ෂයේ සිට සියලුම නිලධාරීන් සඳහා ඔවුන්ගේ අවශ්‍යතා මත පදනම්ව අවම වශයෙන් පැය 12 ක පුහුණු අවස්ථා ලබා දී ඇත.
20	සමස්ත කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි කාර්ය සාධන ගිවිසුම් කෙටුම්පත් කර නොතිබීම හෝ ඇතුලත් කර නොතිබීම.	සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීමට කටයුතු කර ඇත.	2024 වර්ෂයේ සිට කාර්ය සාධන ගිවිසුම් කෙටුම්පත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.

21	ආයතනයේ ගිණුම් පිළිබඳව විගණන මතය පිළිනොගන්නා මතයක් හෝ අහිතකර මතයක් වීම.	උපදෙස් ලබාදෙන ලදුව, ආයතනයේ ගිණුම් පිළිබඳව ජාතික විගණන කාර්යාලයෙන් පිළිනොගන්නා මතයක් ලැබීම වැළැක්වීම සඳහා කටයුතු කර ඇත.	අප විසින් 2022 සහ 2023 මූල්‍ය වර්ෂයන් සඳහා ජාතික විගණන කාර්යාලයෙන් සුදුසුකම් ලද මතයක් ලබාගෙන ඇති අතර ඉදිරියේ දී ද සුදුසුකම් ලද මතයක් ලබාගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
22	කාර්ය සාධන අභිමතාර්ථ නියමිත දිනට ඉදිරිපත් නොකිරීම.	කාර්ය සාධන අභිමතාර්ථ නියමිත දිනට ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබාදෙන ලදී.	2023 වර්ෂයේ සිට නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇත.
23	දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් පවත්වා නොතිබීම.	කාර්තුවකට වරක් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් පවත්වන ලෙසට අදාළ නිලධාරී වෙත උපදෙස් ලබා දී ඇත.	2024 වර්ෂයේ සිට කාර්තුවකට වරක් ළමා ආරක්ෂණ කමිටු රැස්වීම් සමඟ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් ද පවත්වා ඇත.
24	වර්ෂ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ ප්‍රකාරව ආපදා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොමැත.	වර්ෂ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ පනතේ ප්‍රකාරව රැස්වීම් පවත්වන ලෙසට ආපදා කළමනාකරණ අංශය වෙත උපදෙස් ලබා දී ඇත.	ආපදා කළමනාකරණ අංශය මගින් 2023 වර්ෂයේ සිට කාර්තුවකට වරක් ආපදා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත.
25	සැලසුම් කරන ලද පුහුණු අවස්ථා අතරින් ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කටත් වඩා අඩු විය.	පුහුණු අවස්ථා ඉහළ නංවන ලෙස පුහුණු කිරීම් ඒකකය වෙත උපදෙස් ලබා දී ඇත.	කාර්ය මණ්ඩලය සාමාජිකයින් 640 දෙනකු සඳහා 2024 වර්ෂයේ දී පුහුණු අවස්ථා ලබා ගත් අතර 2023 වර්ෂයේ සිට සියලුම නිලධාරීන්ට ඔවුන්ගේ අවශ්‍යතා මත පුහුණු අවස්ථා ලබා දී ඇත. එමෙන්ම ඵලදායිතා ඒකකය මඟින් පවත්වනු ලබන දැනුම බෙදාගැනීමේ වැඩසටහන ඔස්සේ සියලුම නිලධාරීන්ට අවස්ථාවන් ලබා දී ඇත.
26	විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කර නොමැත.	විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කරන ලෙසට අදාළ සියලුම නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.	සෑම වර්ෂයකම විගණකාධිපති වාර්තා ලැබුණු පසුව එහි සඳහන් නිර්දේශයන් අතරින් බහුතරයක් ක්‍රියාත්මක කර ඇත.
27	ආයතනය විසින් පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය යෙදවීම අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ඇගයීම සඳහා ක්‍රමවේදය සකස් කිරීමට කටයුතු කර ඇත.	පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ඇගයීමේ ක්‍රමවේදය 2024 වර්ෂයේ දී සකස් කර ඇත.
28	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ හැකියා සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සඳහා හැකියාවන් සහ නිපුණතා සංවර්ධනය කිරීමට කටයුතු කර ඒ සඳහා ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර ඇත.	පුහුණු ඒකකය භාරව අතිරේක දිස්ත්‍රික් ලේකම්වරයා නම් කර තිබුණි. අතිරේක දිස්ත්‍රික් ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ මානව සම්පත් සංවර්ධන සැලසුම් සහ මානව සම්පත් සඳහා හැකියා සහ කුසලතා සංවර්ධනය 2024 වර්ෂයේ දී සකස් කර ඇත.
29	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් නිකුත් කරන ලද නියෝග/ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් නිකුත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස ප්‍රාදේශීය ලේකම්වරුන්ට සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට උපදෙස් ලබා දී ඇත.	2013 වර්ෂයේ පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් රාජ්‍ය ගිණුම් සම්බන්ධව නිකුත් කර ඇති සියලුම නිර්දේශ 2013 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක කර ඇත.

			රාජ්‍ය ගිණුම් කාරක සභාව මගින් අඩුපාඩු සම්බන්ධ නිර්දේශ 15 ක් ලබා දී ඇති අතර, අඩුපාඩු සියල්ල 2023 වර්ෂයේ දී සම්පූර්ණ කර ඇත.
30	උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා විධිමත් ලෙස ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කර නොමැත.	වැලිඔය ප්‍රාදේශීය ලේකම්වරයා ස්ථාන මාරු කිරීම හැර උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති අනෙකුත් නිලධාරීන් සඳහා අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කර ඇත.	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය මගින් සෑම වර්ෂයකම අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරනු ලැබේ. උපරිම සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් පිළිබඳ විස්තර රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන ආයතන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

.....
ඒ. උමාමහේෂ්වරන්
දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මුලතිව්

A.Umamaheswaran,
District Secretary/Government Agent,
District Secretariat,
Mullaitivu.

.....
එම්. සෙල්වරත්නම්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මුලතිව්

M.SELVARATNAM
Chief Accountant
For Govt.Agent/District Secretar
District Secretariat
Mullaitivu.

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සහකාරලේඛ අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය